# නාට්‍ය හා රංග කලාව

නාට්‍ය හා රංග කලාව විෂය හැදෑරීමේ දී, විශේෂයෙන් විෂය නිර්දේශ සකස් කිරීමේ දී මෙම''නාට්‍ය'' යන පදයත් රංග කලාව යන පදයත් ශාස්ත්‍රීය වශයෙන් වෙන වෙන ම අර්ථ දැක්වීමත් කෙරේ. එහෙත් නාට්‍ය රචනයේ සිට නිෂ්පාදන ක්‍රියාවලිය තෙක් ප්‍රායෝගික තලයේ දී මෙය වෙන වෙන ම ක්‍රියාත්මක නො වේ. නාට්‍ය හා රංග කලාව යන සංකල්ප එකිනෙකට සහසම්බන්ධ එක ම ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස *මනමේ නාට්‍ය පෙළෙහි කුමාරයා කුමරිය ගෙන් කඩුව ඉල්ලන අවස්ථාව ගැටුම මුල් කරගත් දෙගිඩියාව හා අවිනිශ්චිත බව මඟින් නිර්මාණය කර ඇත.* ඒ අනුව මෙම අවස්ථාව නාට්‍ය මූලධර්ම අනුව නිර්මාණය කළ ද එය පෙළෙහි ඇත්තේ රඟ දැක්වීම අරමුණු කොටගෙන ය. ඒ සඳහා නළු-නිළි රංගන දායකත්වය මෙන් ම ඇඳුම්, පැලඳුම්, අංග රචනය, නාට්‍යෝපකරණ, සංගීතය වැනි ආනුෂංගික කලාවල දායකත්වය ද ලබා ගැනේ. මෙලෙස නාට්‍ය යන සංකල්පයත් රංග කලාව යන සංකල්පයත් මනා ව සුසංයෝජනය වීම මඟින් සමස්ත නාට්‍ය නිර්මාණය බිහි වන බව අවබෝධ කරගත යුතු ය.

විෂය අධ්‍යයනය කිරීමේ දී නාට්‍ය යන කොටසට නාට්‍ය පෙළ රචනය සඳහා පදනම් වන නාට්‍ය වස්තුව, තේමාව, චරිත නිරූපණය, ගැටුම, සංවාද, රංග විධාන, නාට්‍ය උත්ප්‍රාසය වැනි අංග හා මූලධර්ම ඇතුළත් වේ. නාට්‍යය (Drama) යන්න නිර්වචනය කිරීමේ දී භූමිකා හෝ චරිතාන්තර ගැටුම්කාරී අවස්ථා හෝ මඟින් කතාවක් නිරූපණය කර දැක්වීම යි යන්නෙන් එය තවදුරටත් පැහැදිලි වේ. ඒ හැරෙන්නට ලොව බිහි වී ඇති විවිධ නාට්‍ය සම්ප්‍රදාය ද 'නාට්‍ය' යන්නෙන් අරුත් ගැන්වේ.
උදා: *ග්‍රීක නාට්‍ය කලාව, ඇමරිකානු නාට්‍ය කලාව ආදිය.*

නාට්‍ය යන කොටසට විශේෂයෙන්, පැරණි හා නූතන නාට්‍ය ප්‍රභේද හැදෑරීම ද අයත් වේ. පැරණි නාට්‍ය ආකෘති ලෙස ට්‍රැජඩි, කොමඩි, සැටර්, ප්‍රහසන දැක්විය හැකි ය. නූතන නාට්‍ය ආකෘති ලෙස ස්වාභාවික, යථාර්ථවාදී, අසම්මත දැක්විය හැකි අතර එම නාට්‍ය ආකෘති කෙරෙහි බලපෑම් කළ රීති ලෙස ප්‍රකාශනවාදී, සංකේතවාදී, අධිතාත්ත්වික යන රීති ගත හැකි ය. එසේ ම නූතන නාට්‍ය ප්‍රවණතා ලෙස ආඛ්‍යාන (Eipc), දිළිඳු රංගය, කුරිරු රංගය සහ විකාරරූපී රංගය දැක්වේ. එසේ ම වර්තමාන අවශ්‍යතා සැලකිල්ලට ගෙන සංවාද මණ්ඩප නාට්‍ය, බ්ලැක් බොක්ස් රංගනය වැනි විවිධ මාදිලි ද නාට්‍ය ආකෘති අතර තිබේ. නාට්‍ය යන කොටසට ගැටුම, ලෝකධර්මී හා නාට්‍යධර්මී ශෛලි ආදි නාට්‍ය මූලධර්ම හැරෙන්නට අනුකරණය, සමාරෝපය වැනි සිද්ධාන්ත හැදෑරීම ද අයත් වේ.

විෂය අධ්‍යයනයේ දී රංග කලාව යන්නට රචනය, රඟපෑම සහ නිෂ්පාදනය යන ත්‍රිවිධ කාර්ය අයත් වේ. මෙහි දී නාට්‍ය රචනය නාට්‍ය මූලධර්ම අනුව ගොඩනැඟීම සිදු වුවත් එහි අරමුණු වනුයේ එය වේදිකාව මත ප්‍රේක්ෂකයන්ට රඟ දැක්වීම සඳහා නිර්මාණය කිරීම යි. ඒ නිසා රචකයා ගෙන් ඇරඹෙන ඒ කාර්යය සම්පූර්ණ කරනු ලබන්නේ රංග කලාවෙහි ප්‍රධාන අංගය වූ නිෂ්පාදන ක්‍රියාවලියේ මූලික වගකීම දරන අධ්‍යක්ෂවරයා යි.

රංග කලාව යන්නට අයත් වන නළුනිළි රංගනය මඟින් පෙළ අර්ථය වේදිකාව මත රංගයක් බවට පත් කෙරේ. එය භාවපූර්ණ හා අර්ථපූර්ණ ලෙසත් මනා ප්‍රේක්ෂාවකින් යුතුව ත් නිර්මාණය කිරීම සඳහා ඇඳුම් පැලැඳුම්, අංග රචනය, වේදිකා පසුතල, සංගීතය, රංගාලෝකය නාට්‍යෝපකරණ වැනි ආනුෂංගික කලාවල දායකත්වය ලබා ගැනේ. ඒ හැරෙන්නට රංග වින්‍යාසය, හඬ, විවිධ ආලෝක හා තාක්ෂණික උපක්‍රම ද රංග කලාවට අයත් ය.

නාට්‍ය හා රංග කලාව විෂය පුළුල් ව හැදෑරීම සඳහා මේ අංග ද්වය වෙන වෙන ම අරුත් දැක්වීමකට භාජනය කර ඇති බව අවබෝධ කරගත යුතු ය. එසේ ම 'නාට්‍ය' යන්නට මෙහි දී රේඩියෝ, රූපවාහිනී නාට්‍ය ද එම අදාළ මාධ්‍ය අනුව ඇතුළත් බව ද සැලකිල්ලට ගත යුතු ය. එසේ ම රංග කලාව යන්නට රඟපෑම සහ ආනුෂංගික කලා ඇතුළත් ඔපෙරා, බැලේ, මුද්‍රා නාට්‍ය හා

ඉඟිනළුව ද ඇතුළත් වේ. මේවා මාධ්‍ය වශයෙන් වෙනස් වුව ද 'නාට්‍ය' මූලධර්ම අනුව සකස් වී ඇත.

රංග ශෛලිය හා විචාරය වැනි සංකල්ප නාට්‍ය මූලධර්ම කොටසට මෙන් ම රංග කලාව යන ප්‍රායෝගික කොටස සමග ද එකිනෙකට සම්බන්ධ වේ.

## නාට්‍ය කලාව හා සම්බන්ධ පාරිභාෂික වචන

### නාට්‍ය පෙළ (Script)

- නාට්‍යෝචිත කතාවක්, අවස්ථාවක්, සිද්ධියක් හෝ එවැනි අවස්ථා, සිද්ධි කීපයක් හෝ රංගෝචිත ලෙස ලියා සකස් කරගත් විට එය **නාට්‍ය පෙළ** යනුවෙන් හැඳින්වේ.
- බොහෝ අවස්ථාවල නාට්‍ය පෙළක කතා වස්තුවක් තිබේ. එසේ නොවන අවස්ථා ද දක්නට ලැබේ.
- නාට්‍යය, රඟ දක්වා පෙන්වීම සඳහා නිර්මාණය කරන්නක් බැවින් නාට්‍ය පෙළ හුදෙක් ප්‍රේක්ෂකයා අරමුණු කරගෙන නිර්මාණය විය යුතු ය. නාට්‍ය පිටපත රූපණය සඳහා ම නිර්මාණය වූවකි.
- එහෙත් නාට්‍ය පෙළ කියවීමෙන් වුව ද කෙනෙකුට එක්තරා ආකාරයක රසාස්වාදයක් අත්දැකිය හැකි අතර, එම රසය නාට්‍යය නැරඹීමෙන් ලැබෙන රසයට වඩා හාත්පසින් ම වෙනස් ය.
- ලිඛිත පිටපතක් වන මෙය සංවාද වලින් හා රංග විධානවලින් සමන්විත ය.
- අවස්ථා ප්‍රතිනිර්මාණය කිරීම සඳහා නළුනිළියනට මෙකී සංවාද හා රංග විධාන සහිත නාට්‍ය පෙළ අවශ්‍ය වේ.
- නාට්‍යයක් නිර්මාණය කළ හැකි විභව ශක්තියක් නාට්‍ය පෙළ තුළ ඇත.
- නාට්‍ය පෙළ පදනම් කරගෙන නාට්‍ය නිර්මාණය එළි දකී.
- නාට්‍ය පෙළක් ලිවීමේ දී ඒ සඳහා වාච්‍යාර්ථය අබිබවා ව්‍යංග්‍යාර්ථ දනවන ප්‍රාණවත් බස් වහරක් යොදා ගත යුතු ය.
- වාචිකාභිනය සඳහා පාදක වන්නේ නාට්‍ය පෙළ බැවින්, නාට්‍ය නිර්මාණයක් සඳහා පෙළ ඉතා වැදගත් වේ.

## නාට්‍ය අධ්‍යක්ෂ / නිෂ්පාදක (Drama director/produser)

- ✓ නාට්‍ය නිෂ්පාදනය සම්බන්ධ ව මූලික වගකීම දරනු ලබන්නේ නාට්‍ය අධ්‍යක්ෂවරයා ය.
- ✓ නාට්‍ය රචකයා විසින් ලියා තබන ලද නාට්‍ය පිටපත සජීව කලාවක් හැටියට වේදිකාවේ ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා මූලික වන්නේ අධ්‍යක්ෂවරයා ය.
- ✓ එක ම නාට්‍ය පිටපතක් විවිධ අර්ථකථන මතු කරමින් නිර්මාණය කිරීමට අධ්‍යක්ෂවරයාට නිදහස තිබේ.
- ✓ නිෂ්පාදන ක්‍රියාවලියේ දි අධ්‍යක්ෂවරයා ශිල්පීන් රාශියක ගේ සහයෝගය ලබාගත යුතු බව ය.
- ✓ නාට්‍ය පෙළ ආශ්‍රිත ව නිෂ්පාදන පිටපත සකස් කරගැනීමත්, එය නාට්‍යයට සම්බන්ධ සියලු දෙනා සමඟ සාකච්ඡා කර අරුත් සියල්ල මතු කර, පැහැදිලි කරගැනීමත් නාට්‍ය අධ්‍යක්ෂ ගේ කාර්යභාරයකි.
- ✓ නාට්‍ය අධ්‍යක්ෂවරයා බොහෝ අය සමග සුහද ව කටයුතු කරන, එහෙත් තම අදහස් යට කිරීමට ඉඩ නොතබන සොඳුරු ආඥාදායකයකු ලෙස හැඳින්විය හැකි ය.
- ✓ නිෂ්පාදන පහසුව තකා අධ්‍යක්ෂවරයා සහාය අධ්‍යක්ෂවරයකු ගේ සේවය ලබාගනී.
- ✓ නාට්‍යයේ මුදල් හා සම්බන්ධ කටයුතු වෙනුවෙන් අධ්‍යක්ෂවරයා ගේ කැමැත්ත මත මුදල් වියදම් කරන්නකු (අර්ථපතියකු) යොදාගත හැකි ය.
- ✓ අප රටේ බොහෝ විට අධ්‍යක්ෂවරයා හා නිෂ්පාදකවරයා එක් තැනැත්තෙක් වෙයි. ඇතැම් විට පෙළ රචනය ද ඔහු ගේ ම කාර්යයක් වී ඇත.
- ✓ නළුනිළියන් දිරි ගැන්වීම, ඔවුන් ගේ උපරිම ඵලදායිතාව ලබාගැනීම, ඉවැසීම, නව යෝජනා හා අදහස් මැදහත් සිතින් ඉවැසීම, නළු-නිළියන්ට රංගනයේ දී නිදහස් ව ක්‍රියා කිරීමට ඉඩදීම ආදි ගුණාංග අධ්‍යක්ෂවරයා සතු ව පැවතිය යුතු ය.

## රංග භූමිය

- ➢ රංග පීඨය, රඟමඬල, කරළිය, වේදිකාව ආදි නම්වලින් හැඳින්වෙන මෙය ආගමික ඇදහිලි හා පුද පූජා සමඟ බිහි වූවකි. මුලින් වෘත්තාකාර භූමියක් රංග භූමිය වශයෙන් යොදා ගැනුණු අතර, ක්‍රමයෙන් එය පින්තූර රාමු වේදිකාව තෙක් විකාශය විය.
- ➢ ග්‍රීසියේ දියෝනීසස් රඟහල, එළිමහන් රංග පීඨයක් වූ අතර, එහි ප්‍රධාන ලක්ෂණ වශයෙන් ප්‍රේක්ෂාලය (Theatron) ඕර්කෙස්ට්‍රාව (Orchestra) වේදිකා ගෘහය (Skene) හැඳින්විය හැකි ය.
- ➢ රෝම රඟමඬලෙහි ප්‍රේක්ෂක මණ්ඩපය(කෙවියා - Cavea) අර්ධ කවාකාර මණ්ඩපයක් ද , වේදිකා ගෘහය අතිශයින් විසිතුරු කේවල මණ්ඩපයක් ද (ස්කීනියා ෆ්‍රොන්ස් -Scaenae Frons) වේ. මෙම රඟහල තැනිතලා බිමක ඉදි කරන ලද්දකි.

- මධ්‍යකාලීන රංග ශාලා අතර මණ්ඩප වේදිකාව (Platform Stage) සන්දර්ශන රථ (Pgeant vagon), ප්ලැටියා හෙවත් පොදු රංග භූමිය (Platea) ආදිය දැක්විය හැකි ය.

- එලිසබෙතීන යුගයේ ග්ලෝබ් වේදිකාව ආකෘතිකමය වටනාකමකින් යුක්ත වූ අතර පසුකාලීනව වෙනත් විවිධ ලක්ෂණ එයට ඇතුළත් විය.

- පුනරුදය යුගයේ පසුතල, චිත්‍ර වස්ත්‍ර භාවිතය සමඟ Proscenium (ඉදිරියේ -දර්ශනය) ආරුක්කු (Arch) අර්ථය ඇති ව ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව බිහි වූයේ ය.

- නූතන ප්‍රොසීනියම් වේදිකාව භූගෝලීය වශයෙන් මනඃකල්පිත කොටස් *නවයකට* බෙදිය හැක.

| | | | |
|---|---|---|---|
| **up satage** | උඩ / ඉහළ<br>දකුණ | උඩ / ඉහළ<br>මැද | උඩ / ඉහළ<br>වම |
| | මැද<br>දකුණ | මැද | මැද<br>වම |
| **down stage** | යටි / පහළ<br>දකුණ | යටි / පහළ<br>මැද | යටි /පහළ<br>වම |

## රංග භූමි අලංකරණය (Stage decorative)

- නාට්‍ය පෙළෙන් කියැවෙන පසුබිම අර්ථවත් කිරීම සඳහා වේදිකාව සකස් කිරීම රංගභූමි අලංකරණය හෙවත් වේදිකා **පසුතල නිර්මාණ** යන නමින් හැඳින්වේ.

- පසුතල සකස් කිරීම හා විචිත්‍රත්වය සඳහා විවිධ උපකරණ, තිර, දර්ශන ආදිය යොදා ගන්නා අතර හා ඇතැම් විට එයින් තේමාව, අන්තර්ගතය ආදිය සංකේතාත්මක ව ප්‍රකාශ වේ.

- ඇතැම් විට නාට්‍ය පෙළෙහි පසුතල පිළිබඳ ව දක්වා ඇති විස්තරය රංගභූමිය නාට්‍යයට උචිත පරිදි සකස් කර ගැනීම සඳහා උපකාරී වෙයි.

- නාට්‍යයේ ශෛලිය අනුව වේදිකා පසුතල පිළිබඳ සංකල්පය වෙනස් වන අතර, බොහෝ විට වර්තමාන යථාර්ථවාදී රංගනයේ දී නාට්‍යයේ අවස්ථා, සිදු වන වකවනුව, ඊට අදාළ පරිසරය, සමාජ ආර්ථික තත්ත්වය හා පුද්ගල මනෝභාවයන් ඉස්මතු කරන අයුරින් වේදිකා පසුතල නිර්මාණය විය යුතු ය. එහි දී වර්ණ සංයෝජනයත්, රංගාලෝකය සමඟ මනා ව සම්මිශ්‍රණය වීමත් දෘශ්‍ය රූප ප්‍රබල කිරීමට හේතු වෙයි.

- නූතන තාක්ෂණික භාවිතය සමඟ ගගනිකාව ඇසුරින් විවිධ පසුතල නිර්මාණ ප්‍රතිනිර්මාණය කරගත හැකි ය.

- ඉක්මනින් සවි කිරීමේ හා ගැලවීමේ පහසුව, ප්‍රවාහණ පහසුව, නාට්‍යෝපකරණ බහුකාර්ය සඳහා යොදා ගත හැකි වීම, ඇසිරීමේ පහසුව, ශක්තිමත් බව ආදි කරුණු පසුතල නිර්මාණයේ දී වැදගත් වෙයි.






### වේෂ භූෂණ සහ අංග රචනය (Costume & Makeup)

- නාට්‍යයේ චරිතයට ගැළපෙන ආකාරයට නළුවා ගේ බාහිර ස්වරූපය, වේෂ භෂණ හා අංග රචනය මඟින් අලංකාර කිරීම **වෙස් මෝස්තර නිර්මාණය** නමින් ද හැඳින්වේ.

- බාහිර සමාරෝපය ඇති කිරීම සඳහා වේෂ භූෂණ ප්‍රධාන තැනක් ගනී.

- වේෂ භූෂණ නිර්මාණය කිරීමේ දී නාට්‍යයේ තේමාව, ශෛලිය, සංස්කෘතික පසුබිම, චරිත ස්වභාවය මෙන් ම යුගය, කාලය ආදි කරුණු ගැන ද සැලකිලිමත් විය යුතු ය.

- සරල වීම, පහසුවෙන් භාවිතයට ගත හැකි වීම සහ රඟපෑමට පහසු වීම යන කරුණු වේෂ භූෂණ නිර්මාණයේ දී අවධානයට ලක් විය යුතු ය.

- වේෂ භූෂණයේ හා අංග රචනයේ දී වර්ණ සංයෝජනය හා රංගාලෝකය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

- වේෂ නිරූපණ ශිල්පියා ගේ කාර්යය රූප ලාවණ්‍ය ශිල්පියකු ගේ කාර්යයට වඩා බෙහෙවින් වෙනස් වේ. චරිතයේ ලක්ෂණ ඉස්මතු කරමින් නාට්‍යයේ භූමිකාවට අදාළ වන අයුරින් වෙස් ගැන්වීම වේෂ නිරූපණ ශිල්පියා ගේ කාර්යයකි.





## රංග භූමි ආලෝකකරණය (Stage lighting)

- ➔ පෙරදිග නාට්‍ය කලාවේ මුල් අවදියේ අඳුර පලවා හැරීම අරමුණු කොටගෙන පන්දම් හා පහන් වර්ග යොදා ගත්හ.

- ➔ නාට්‍යයේ ප්‍රාසංගික ලක්ෂණ ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ අර්ථය පුළුල් හා තීව්‍ර කිරීමේ කාර්යය සඳහා භාවිත කෙරෙන භාෂාවක් පරිද්දෙන් රංග ආලෝකය යොදා ගැනේ.

- ➔ වේදිකා නාට්‍යයක දී වේදිකාවේ රඟපාන නළුනිළියන් ද පසුතල, වේෂ භූෂණ හා වේදිකා මෙවලම් ආදිය සූක්ෂම ලෙස හා අර්ථාන්විත ආකාරයෙන් කලාත්මක ව ඉදිරිපත් කිරීම සඳහා රංගාලෝක සැලැසුමක් මෙන් ම රංගාලෝක ශිල්පියෙක් ද අවශ්‍ය වේ.

- ➔ ගලා යන එළිය යන අර්ථය දෙන ධාරා පහන් හෙවත් ෆ්ලඩ් ලාම්පු (Flood Light) ඉලක්කය වෙත විහිදී යන අර්ථය දෙන යොමු පහන් හෙවත් ස්පොට් ලාම්පු (Spot Light). තීරු ලාම්පු යන අර්ථය දෙන ස්ට්‍රිප් ලාම්පු (Strip Light / Batten Light) වර්ණ චක්‍ර (Colour Wheels) ආදි උපකරණ රංගාලෝකය සඳහා භාවිත කෙරේ.



## ප්‍රේක්ෂාව - (Spectacle)

- ➢ නාට්‍ය කලාවට සම්බන්ධ ප්‍රේක්ෂාව (Spectacle) පිළිබඳ ව පැරණි හා නවීන අර්ථ කීපයක් ඇත.

- ➢ නාට්‍ය කලාවට සම්බන්ධ ව මෙම සංකල්පය ඇරිස්ටෝටල් විසින් පෙන්වා දෙනු ලැබ ඇත්තේ වේදිකාවේ ''දෘෂ්ටි ගෝචර භාවය'' යනුවෙනි.

- ➢ නාට්‍යයක් නරඹන විට ප්‍රේක්ෂකයා ඉදිරියේ රංග භූමිය මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය **''ප්‍රේක්ෂාව''** වේ.

- ➢ රංග භූමියක් මත දිග හැරෙන නාට්‍යයක් ප්‍රේක්ෂකයා ඇදබැඳ ගැනීමට මුල් වන එක් සාධකයකි ''ප්‍රේක්ෂාව''.

- ➢ නාට්‍යයේ ප්‍රේක්ෂාවක් මැවීම සඳහා නිෂ්පාදනයේ දෘෂ්ටිමය පැත්ත වන පසුතල නිර්මාණ (Scenery) වස්ත්‍රාභරණ (Costumes), ආලෝකය (Lighting), අංගරචනය (Makeup), නාට්‍යෝපකරණ (Stage properties) සහ රූපණ ශිල්පීන් ගේ කුශලතා පිරි රංගනය ආදිය වැදගත් ය.

- ප්‍රේක්ෂකයා ඉදිරියේ ප්‍රේක්ෂාව සිදු වන බැවින් එහි කිසියම් චමත්කාරයක් හා රසඥතාවක් තිබිය යුතු ය.

## ප්‍රේක්ෂකයා – (Audience)

- ✓ ප්‍රේක්ෂකයා නාට්‍යයේ කොටසක් ලෙස සැලකේ. නාට්‍යයක් වර්ධනය වන්නේ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ය.

- ✓ නාට්‍යයක අත්‍යවශ්‍ය ම අංගත්‍රයෙන්(පෙළ, නළුවා, ප්‍රේක්ෂකයා) එක් සාධකයක් ලෙස ප්‍රේක්ෂකයා සැලකේ.

- ✓ ප්‍රේක්ෂකයා යනු විචාරකයකු, රසිකයකු පමණක් නො ව, විනිශ්චයකරුවෙක් ද වෙයි. බුද්ධිමය ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයේ ගුණාත්මක බව තක්සේරු කිරීමට හේතු වන නිර්ණායකයකි.

## රංග වින්‍යාසය - (Choreography)

- ❖ නාට්‍යයක කිසියම් අවස්ථාවකට හෝ සිදුවීමකට හෝ අවශ්‍ය පරිදි චලන හා රිද්ම මනා ව පෙළ ගැස්වීම **රංග වින්‍යාසය** හෙවත් **රංග රචනය** යනුවෙන් හැඳින්විය හැකි ය.

- ❖ රංග වින්‍යාසය මුලින් ම පෙළ ගැස්වෙන්නේ නාට්‍ය පෙළට හා එහි ශෛලියට අනුව නාට්‍ය රචකයා ගේ නිර්මාණාත්මක චින්තනයේ ය.

- ❖ පෙළ ජීවමාන කිරීමේ දී සිද්ධි හා අවස්ථා මාලාවට ගැළපෙන පරිද්දෙන් රංග වින්‍යාසය සකස් කෙරේ.

- ❖ නාට්‍යයේ ගැඹුර, චමත්කාරය, නිරූපණය තීව්‍ර කිරීම සඳහා මනා කුශලතාවක් රංග වින්‍යාස ශිල්පියා සතු ව පැවතිය යුතු වේ.





## රංග භූමි පාලනය (Stage Management)

- නාට්‍ය අධ්‍යක්ෂවරයාට අමතර ව රංග භූමියේ සියලු ම කටයුතුවල වගකීම දරන්නේ රංග භූමි පාලකයා ය.

- රංග භූමි පාලකයා ඇතැම් විට වේදිකා පාලක ලෙස ද, රංග කළමනාකරු ලෙස ද හැඳින්වෙන අතර, ඔහු අධ්‍යක්ෂවරයා ගේ ප්‍රධාන සහායකයකු ලෙස සැලැකිය හැකි ය.

- නාට්‍යයක් වේදිකාගත කිරීමේ දී රංග භූමිය හා නිෂ්පාදනය සම්බන්ධ සැම කටයුත්තක ම වගකීම ඔහුට පැවරේ.

- නාට්‍ය නිෂ්පාදනයේ දී දර්ශන සංවිධානය කිරීම, රංග භූමිය හා නළු-නිළියන් සම්බන්ධ සියලු ම කටයුතු කිරීම ආදි කටයුතුවල වගකීම රංග භූමි පාලකයා සතු ය.

- රූපණ ශිල්පීන් ගේ හැසිරීම් පාලනය කිරීම, අනිකුත් ආනුෂංගික කලාකරුවන් ගේ සහාය ලබාගැනීම ආදිය ඉටු කරමින් නාට්‍යයක් වේදිකාවට නැංවීමේ වගකීම දරනු ලබන්නේ රංගභූමි පාලකයා විසිනි.

- නාට්‍යයට සම්බන්ධ වන සියලු ම දෙනා මෙහෙයවමින් නාට්‍ය දර්ශනය ආරම්භ කිරීමත්, පවත්වාගෙන යාමත් රූපණ ශිල්පීන් ගේ අදෘශ්‍යමාන සහායකයා ලෙස කටයුතු කරන වේදිකා පාලකවරයා ගේ උපදෙස් අනුව සිදුවේ.

- වේදිකා පාලකයා හා ඔහු ගේ සහායකයන් ප්‍රේක්ෂකයාට දෘශ්‍යමාන නොවුණ ද ඔවුහු නාට්‍ය නිෂ්පාදනය සාර්ථක කිරීමට අනුබල දෙති.

- ඉතා හොඳ නාට්‍යයක් වුවත්, වේදිකා පාලක ගේ දුර්වලත්වය හේතුවෙන් අසාර්ථක විය හැකි ය.

## රංග භූමි තාක්ෂණය – (Stage techniques)

- නූතන වේදිකාව මත නාට්‍යයක නිරූපිත අවස්ථා වඩා චමත්කාර කරගැනීම සඳහා තාක්ෂණ උපක්‍රම බෙහෙවින් භාවිත කැරේ.

- නාට්‍යයක් රඟ දැක්වීමේ දී වේදිකාවක් සැකසීමේ පටන් නිෂ්පාදන කාර්යය පරිසමාප්තියට පත් වන අවස්ථාව තෙක් රංග උපක්‍රම භාවිත කැරේ.

- නාට්‍යයට අදාළ ආලෝකය සැපයීම, සංගීතය සැපයීම, රංග භූමි අලංකරණය යන සැම රංග උපකරණ භාවිතයට ගැනීමක් ම රංග භූමි තාක්ෂණයට අයත් වෙයි. අවස්ථා නිරූපණය ගැඹුරින් ප්‍රකාශ කිරීමට ඒවා උපයෝගි වෙයි.

- භීතිය, ත්‍රාසය, විස්මය, ගැටුම් අවස්ථා මෙන් ම ඉතා සියුම් භාව ප්‍රකාශන දැනවීම සඳහා ද ශබ්ද තාක්ෂණය බහුල ව යොදාගැනේ.

- විදුලිය කෙටීම, හෙණ හඬ, සුළං ආදිය වේදිකාවේ මවා පෙන්වීම සඳහා ද මෙම ශබ්ද හා දෘශ්‍ය භාණ්ඩ භාවිත කෙරේ.

- නූතන නාට්‍යවල රංග භූමි තාක්ෂණය සඳහා නූතන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්, සිනමාව ආදිය විවිධාකාරයෙන් භාවිත කෙරෙයි.

## නාට්‍යෝපකරණ (වේදිකා මෙවලම්) - (Stage Properties)

- චරිතය හා සම්බන්ධ ව නළු-නිළියන් විසින් භාවිත කෙරෙන භාණ්ඩ **නාට්‍යෝපකරණ** නමින් හැඳින්වේ.

- නාට්‍යෝපකරණ බොහෝ විට වේදිකා පසුතලය සමඟ ද සම්බන්ධ වේ.

- නාට්‍යයක දී මෙම වේදිකා මෙවලම් ඉතා වැදගත් ය.

- වේදිකා මෙවලම් නිර්මාණය කිරීමේ දී සරල බව, පහසුවෙන් පරිහරණය කල හැකි වීම මෙන්ම ,මිල අඩු අමුද්‍රව්‍ය පරිහරණය කිරීම ද අවශ්‍ය වේ.

- නළුවා ගේ රංගනයට මෙන් ම චරිතය ඉස්මතු කිරීමට ද වේදිකා මෙවලම් බලපායි.

- භාණ්ඩ නිර්මාණයේ දී එහි හැඩය, වර්ණය හා බර පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු ය.

- සැබෑ භාණ්ඩ හා නාට්‍යෝපකරණ අතර පැහැදිලි වෙනසක් දැකිය හැකි ය.

- වේදිකා මෙවලම් භාවිතයේ දී පුහුණුවීම් අවස්ථාවල භාවිතා කැරෙන මෙවලම් නාට්‍ය දර්ශනයේදී ද භාවිත කිරීම ඉතා වැදගත් ය.





